# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/29 - 2023 දෙසැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2023.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/2005 (III) A

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

26 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නියමය

සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු වන මම, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශ සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 28 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හබරණ - 589, හිරිවඩුන්න - 591, කුඩාරාඹාවැව - 595, කුඹුක්වැව - 596, පලුගස්වැව - 601, මඩවල - 598, දෙමුන්නැව - 594, හොරිවිල - 603, ගලපිටගල - 604, කාශ්‍යපගම - 590 සහ වායා උල්පත - 592 යන ග්‍රාම නිලධාරී වසම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් දොළොස් දහස් හත්සිය අසූ හයකින් (හෙක්. 12,786) සමන්විත වූ භූමි ප්‍රදේශය.

EOG 10 - 0389


1A - PG 6597 — 381 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*